ශ්‍රී ලංකා බාලදක්ෂ සංගමය
இலங்கை சாரணர் சங்கம்
Sri Lanka Scout Association

Incorporated by Parliamentary Act No. 13 of 1957
Member of the World Organization of Scout Movement


2026.09.08

චක්‍රලේඛ අංක 69/2026

සියළුම දිසා කොමසාරිස්වරුන් වෙත,

## සමූහ නායක කවුන්සිලය පිහිටුවීම හා සමූහ ආධාර කමිටුව පිහිටුවීම

බාලදක්ෂ සමූහයන් හි පරිපාලන කටයුතු හා ක්‍රියාකාරීත්වය විධිමත් කිරිම සඳහා සමූහ නායක කවුන්සිලය හා සමූහ ආධාර කමිටුව සෑම බාලදක්ෂ සමූහයක් අශ්‍රිතව ක්‍රියාත්මක කලයුතු බව මෙයින් අවධාරණය කරනු ලබයි. 2026 සැප්තැම්බර් මස 30 දිනට පෙර සෑම බාලදක්ෂ සමූහයක් ආශ්‍රිතව සමූහ නායක කවුන්සිලය හා සමූහ ආධාර කමිටුව පිහිටුවීමට අවශ්‍ය පියවර ගත යුතු වේ. පහත සඳහන් උපදෙස් හා මගපෙන්වීම් අනුව කටයුතු කළ යුතු ය.

### 1. සමූහ නායක කවුන්සිලය

සිඟිති, පෝතක, කණිෂ්ඨ හා ජ්‍යෙෂ්ඨ බාලදක්ෂ අංශය හෝ මානවක බාලදක්ෂ අංශය යන අංශ වලින් දෙකක් හෝ කිහිපයක් ක්‍රියාත්මක වන පාසල් තුල ඇති ඉහත කී කණ්ඩායම් වල එකතුව බාලදක්ෂ සමූහයක් ලෙස අර්ථ දැක්වේ.

සියළුම බාලදක්ෂ සමූහ ආශ්‍රිතව සමූහ නායක කවුන්සිලය පිහිටුවීමට සියළු ම සිඟිති,පෝතක,බාලදක්ෂ හා මානවක නායක නායිකාවන්ට උපදෙස් ලබා දිය යුතු ය.

**සමූහ නායක කවුන්සිලයේ සංයුතිය**

i. **සභාපති** - සමූහ බාලදක්ෂ නායක නිල බලයෙන් පත් වේ. (විදුහල්පති හෝ ආයතන ප්‍රධානී සමූහ බාලදක්ෂ නායක ලෙස කටයුතු කල යුතු ය. එහෙත් විදුහල්පතිගේ හෝ ආයතන ප්‍රධානීගේ අභිමතය පරිදි, නම් කරනු ලබන බාලදක්ෂ කටයුතු භාර පාසල් ගුරුභවතකු සභාපති ලෙස පත් කළ හැකි ය.) සමූහ බාලදක්ෂ නායක වශයෙන් විදුහල්පතිවරයා හැර වෙනත් අයෙකු කටයුතු කරන අවස්ථාවක විදුහල්පතිවරයා සමූහ නායක කවුන්සිලයේ ප්‍රධාන තීරක හා අනුශාසක ලෙස කටයුතු කළ යුතු ය.

ii. **ලේකම්** - සිඟිති, පෝතක, බාලදක්ෂ සහ මානවක යන අංශ නියෝජනය කරන නායකයකු හෝ නායිකාවක්.

iii. **සාමාජිකයන්** - සිඟිති, පෝතක, බාලදක්ෂ හා මානවක යන අංශ නියෝජනය කරන සියළු ම නායක නායිකාවන් සහ සහය නායක නායිකාවන්.

**සමූහ නායක කවුන්සිලයේ කාර්යභාරය**

i. බාලදක්ෂ සමූහයේ පරිපාලන කටයුතු පිළිබඳ තීරණ ගැනිම.
ii. බාලදක්ෂ සමූහයේ අංශ අතර ඍජු සම්බන්ධතාව පවත්වාගෙන යාම.
iii. බාලදක්ෂ සමූහයේ සියළු දරුවන්ගේ විනය පවත්වාගෙන යාමට කටයුතු කිරීම.
iv. කාණ්ඩ ක්‍රමය හා එයට අදාල පරිදි කටයුතු මැනවින් ක්‍රියාත්මක කිරීම.
v. සිඟිති, පෝතක, බාලදක්ෂ සහ මානවක බාලදක්ෂ දරුවන්ගේ ප්‍රගතිය සම්බන්ධව මාසිකව විධිමත් ඇගයීමකට ලක් කිරිම.
vi. සිඟිති, පෝතක, බාලදක්ෂ සහ මානවක නායක නායිකාවන්ගේ අවශ්‍යතා පිළිබඳව සොයා බලා කටයුතු කිරීම.
vii. සිඟිති, පෝතක, බාලදක්ෂ සහ මානවක යන සියළු අංශ වල කටයුතු පවත්වාගෙන යාමේදී පැන නගින ගැටළු හා අවශ්‍යතා පිළිබඳ සොයා බලා ඒවා සපුරාලීමට අවශ්‍ය පියවර ගැනීම.


65/9 ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත, කොළඹ 02. ශ්‍රී ලංකා
சேர் சிற்றம்பலம் ஏ காடினர் மாவத்தை, கொழும்பு 02.
Sir Chittampalam A Gardiner Mawatha, Colombo 02, Sri Lanka.

Tel : +94 112 433131 / +94 112 433512
Fax : +94 112 433131
E-mail : slsaheadq@gmail.com
Web : www.scout.lk

viii. පාසල් සංවර්ධන සමිතිය හා ආදි ශිෂ්‍ය සංගමය සමග මනා සම්බන්ධතාව පවත්වාගෙන යාම.

ix. විදුහල්පතිතුමාගේ/ආයතන ප්‍රධානීගේ අනුමැතියට යටත්ව අධ්‍යාපන අමාත්‍යංශය ඇතුළු වෙනත් රාජ්‍ය ආයතන හා රාජ්‍ය නොවන ආයතන සමඟ කටයුතු කිරීම.

x. දිසා, පලාත් හා ජාතික මට්ටමේ සියළු ක්‍රියාකාරකම්හිදී සිහිති, පෝතක, බාලදක්ෂ සහ මානවක බාලදක්ෂ අංශ නියෝජනය කරමින් මනා සම්බන්ධීකරණයෙන් යුතුව සහභාගී වීම.

xi. සමූහයේ උන්නතිය සඳහා සිදුකල යුතු ඇගයීම් සිදු කිරීම සහ සමූහයේ ගුණාත්මක භාවය වර්ධනය කිරීම සඳහා පාසල් පද්ධතිය තුල සිදු කළ යුතු සියළු කටයුතු සිදු කිරීම.

xii. සිහිති, පෝතක, බාලදක්ෂ සහ මානවක යන සියළුම අංශ නියෝජනය කරන නායක නායිකාවන්ගේ විනය ගැටළු මතුවන අවස්ථාවකදී ඒ සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ග ගැනිම.

xiii. සිහිති, පෝතක, බාලදක්ෂ සහ මානවක යන සියළුම අංශයන් හි පෙර මාසය තුල සිදුකළ කටයුතු පිළිබඳ වාර්තාවක් ඉදිරිපත් කර ඒ පිළිබඳ සමාලෝචනය කිරීම සහ ඉදිරියේ දී ක්‍රියාත්මක කිරීමට යෝජිත ව්‍යාපෘති සහ ඉදිරි මාසයේ වැඩසටහන් පිළිබඳව සමූහ නායක කවුන්සලය දැනුවත් කිරීම සහ ඒ සම්බන්ධව වාර්තා ඉදිරිපත් කිරීම.

xiv. දිසාවේ හා ජාතික බාලදක්ෂ මූලස්ථානයේ වාර්ෂික වැඩසටහනට අනුගතව සහ ඒවාට බාධාවක් නොවන පරිදි සමූහයේ වාර්ෂික වැඩසටහන සකස් කර ගැනීම සහ එය එක් එක් අංශ මගින් ක්‍රියාවට නැගීමට කටයුතු කිරීම.

xv. කාලානුරූපීව බාලදක්ෂ දිසාව හෝ ජාතික මූලස්ථානය මගින් පවරනු ලබන ව්‍යාපෘති/වැඩසටහන්/කඳවුරු/පුහුණු කිරීම් යනාදිය සඳහා සක්‍රීයව තම සමූහයේ අදාල අංශයන් සම්බන්ධ කිරීම හා ඒවාට අනුගතව කටයුතු කිරීම.

xvi. සමූහ ආධාර කමිටුව සමග අන්‍යෝන්‍ය අවබෝධයකින් යුතුව කටයුතු කිරීම සහ අධ්‍යාපන අමාත්‍යංශයේ සහ ශ්‍රී ලංකා බාලදක්ෂ සංගමයේ උපදෙස් හා මාර්ගෝපදේශ සහ චක්‍රලේඛ වලට අනුකූලව සමූහ ආධාර කමිටුව සක්‍රීයව පවත්වාගෙන යාමට කටයුතු කිරීම.

## 2. සමූහ ආධාර කමිටුව

සමූහ බාලදක්ෂ නායකගේ නිර්දේශ හා හෝ විදුහල්පතිතුමාගේ/අංශ ප්‍රධානීගේ අනුමැතියට යටත්ව සමූහයට අවශ්‍ය වන මූල්‍යමය, ද්‍රව්‍යමය හා උපදේශනාත්මක සහය ලබා ගැනීම සඳහා සමූහ ආධාර කමිටුව පිහිටුවීම සිදු කලයුතු වේ.

***සංයුතිය***

i. සමූහ බාලදක්ෂ නායක

ii. සිහිති, පෝතක, බාලදක්ෂ සහ මානවක යන සියළුම අංශ වල සියළු ම නායක නායිකාවන්.

iii. සිහිති, පෝතක, බාලදක්ෂ සහ මානවක යන සියළු ම අංශ වල දරුවන්ගේ දෙමව්පියන්.

***සමූහ ආධාර කමිටුවේ නිලධාරීන් සහ කාරක සභාව***

i. **සභාපති-** සමූහ බාලදක්ෂ නායක නිල බලයෙන් පත් වේ. (විදුහල්පති හෝ ආයතන ප්‍රධානී සමූහ බාලදක්ෂ නායක ලෙස කටයුතු කල යුතු ය. එහෙත් විදුහල්පතිගේ හෝ ආයතන ප්‍රධානීගේ අභිමතය පරිදි, නම් කරනු ලබන බාලදක්ෂ කටයුතු භාර පාසල් ගුරුභවතකු සභාපති ලෙස පත් කළ හැකි ය.) සමූහ බාලදක්ෂ නායක වශයෙන් විදුහල්පතිවරයා හැර වෙනත් අයෙකු කටයුතු කරන අවස්ථාවක විදුහල්පතිවරයා සමූහ ආධාර කමිටුවේ ප්‍රධාන තීරක හා අනුශාසක ලෙස කටයුතු කළ යුතු ය.

ii. **ලේකම් -** සිහිති, පෝතක, බාලදක්ෂ සහ මානවක යන සියළුම අංශ නියෝජනය කරන දරුවන්ගේ දෙමාපියන් අතරින් තෝරාගනු ලබන අයෙක්.

iii. **භාණ්ඩාගාරික** - සිඟිති, පෝතක, බාලදක්ෂ සහ මානවක යන සියළුම අංශ නියෝජනය කරන දරුවන්ගේ දෙමාපියන්ගෙන් එක් අයෙකු.

iv. **කාරක සභා සාමාජිකයන්** - උපරිම 15 දෙනෙකු යෝජනා ස්ථිරත්වයෙන් පත් කර ගත යුතු ය. ඉන් 08 දෙනෙකු සමූහ ආධාර කමිටු රැස්වීමේ දී පැමිණ සිටින සිඟිති, පෝතක, බාලදක්ෂ සහ මානවක යන සියළුම අංශ නියෝජනය කරන දරුවන්ගේ දෙමාපියන් විය යුතු ය. එක් අංශයක් නියෝජනය වන පරිදි දෙමාපියන් දෙදෙනා බැගින් කාරක සභාවට පත්කර ගත යුතුය.

තවත් 07 දෙනෙකු නිල නාමකරණයෙන් නම් කිරීමේ බලය විදුහල්පතිවරයා සතු වන අතර, එහිදී සිඟිති, පෝතක, බාලදක්ෂ සහ මානවක යන අංශ 04 ම නියෝජනය වන පරිදි සමූහය තුල ඇති සැම අංශයක්ම නියෝජනය වන පරිදි සිඟිති, පෝතක, බාලදක්ෂ සහ මානවක නායකයකු/නායිකාවක බැගින් නිල බලයෙන් කාරක සභාවට පත් කර ගත යුතුය. එසේ පත් කිරීමෙන් පසු ඉතිරි පුරප්පාඩු සඳහා දෙමාපියන් අතරින් නිල බලයෙන් පත් කිරීමේ බලය විදුහල්පති තුමා සතුය.

එසේ පිහිටුවීමෙන් අනතුරුව මේ සමග අමුණා ඇති Form/GLC/26 දරන පෝරමය පුරවා දිසා කොමසාරිස්වරයා/වරිය වෙත භාරදීමට කටයුතු කළ යුතු ය.

## *ක්‍රියාකාරීත්වය*

ඉහත සඳහන් අරමුණු ක්‍රියාත්මක කිරීමේ දී වෙන් වෙන් වශයෙන් හෝ සමූහය වශයෙන් ක්‍රියාත්මක වන අවස්ථාවේ දී ඔවුන් විසින් ක්‍රියාත්මක කරන ලද කඳවුරු, බාලදක්ෂ පුහුණු කටයුතු , දිසා මට්ටමින් හා ජාතික මට්ටමේ වැඩසටහන් වලදී ද්‍රව්‍යමය හා මූල්‍යමය දායකත්වය ලබාදීමත් එකී ද්‍රව්‍යමය හා මූල්‍ය කළමණාකරණ කිරිම සඳහා සමූහ නායක කවුන්සිලයට සහයෝගය ලබා දීමත් කමිටුවේ කාර්යභාරය වේ.

ඉහත ආකාරයෙන් ක්‍රියාත්මක වීමේ දී සමූහ නායක කවුන්සලයේ - සිඟිති, පෝතක, බාලදක්ෂ සහ මානවක යන අංශයන්හි නායක නායිකාවන්ගේ ඉල්ලීම් සහ මගපෙන්වීම් පරිදි කටයුතු කළ යුතු අතර, සැම කටයුත්තකදීම විදුහල්පතිවරයාගේ හෝ ආයතන ප්‍රධානියාගේ අනුමැතියට යටත්ව ක්‍රියාත්මක විය යුතු ය.

කමිටුව කුමන ආකාරයෙන් ක්‍රියාත්මක වුවත් අධ්‍යාපන අමාත්‍යාංශයේ සහ ශ්‍රී ලංකා බාලදක්ෂ සංගමයේ උපදෙස්, මාර්ගෝපදේශ සහ චක්‍රලේඛයන්ට යටත්ව කටයුතු කළ යුතු ය.

ස්තුතියි,

මෙයට,

බාලදක්ෂ සේවයේ නියුතු,

**සම්පත් කාරියවසම්**

සහය ප්‍රධාන කොමසාරිස් (කළමණාකරණ හා මූල්‍ය)

Sampath Kariyawasam
Assistant Chief Commissioner
(Management & Finance)
Sri Lanka Scout Association
65/9, Sir Chittampalam A Gardiner Mw,
Colombo 02, Sri Lanka

**නීතිඥ මනෝජ් නානායක්කාර**

ප්‍රධාන බාලදක්ෂ කොමසාරිස්

Manoj Nanayakkara
(Attorney-at-Law)
Chief Commissioner
Sri Lanka Scout Association
65/9, Sir Chittampalam A Gardiner Mw,
Colombo 02, Sri Lanka

පිටපත් -

1. ජාතික මූලස්ථානයේ සියළුම කොමසාරිස්වරුන් - කා.දැ.පි.
2. ශ්‍රී ලංකා බාලදක්ෂ සංගමයේ සභාපති, විධායක කමිටු සභාපති, ගරු ලේකම් හා ගරු භාණ්ඩාගාරික - කා.දැ.පි.
3. කාර්යාල ලිපිගොනුවට